# 23 මංගල සූත්‍රය

පාරායන පිරිවෙනේ ධර්ම සාකච්ඡාව පැවැත්වෙන තුන්වන සතියේ සිකුරාදා දිනයි. රාත්‍රි 7 ට ඇරඹෙන සාකච්ඡාව රාත්‍රි 10ට නිමා වෙයි. එදා සාකච්ඡාවේ මාතෘකාව වූයේ '' සුභ අසුභ සහ මංගල කරුණු ගැන මහජන මතය'යි. සාකච්ඡාව මෙහෙය වූ පරිවෙණාචාර්ය අත්ථදස්සි හිමියෝ සුභ අසුභ ලෙස මහජනයා පිළිගන්නා කරුණු ගැන සභාවෙන් කරුණු විමසූහ. එහිදී සභාවේ සිටි හිමිවරුන් අතරින් කිහිපදෙනෙකු ඉදිරිපත් කළ අදහස් කිහිපයක් මෙසේ සැකවින් දැක්වේ.

සාරද හිමි :

අවසරයි ! මට පෙනෙන හැටියට නම් සුභ අසුභ පල විපාක නොසොයා මිනිසුන්ගේ කිසිවක් සිදුවන්නේ නැහැ. දරුවාට නම් තබන අකුරෙ පටන් සෑම දෙයකට ම සුභ අසුභ පලාපල සොයනවා බත් කැවීම, අකුරු කීම, ගෙට මුල් ගල තැබීම, ගෙවැදීම, පමණක් නොවෙයි මිනියක් එසවීම පවා සිදුවන්නේ පලාපල බලලා, නැකතකට.

රේවත හිමි :

මා කියන්නේ මේ පිළිබඳ තවත් පැත්තක්, ඒ තමයි සුභ අසුභ නිමිති, හුනෙකු හැඬීම, හූණන් ඇඟ වැටීම, බස්සෙකු හැඬීම, කපුටන් කෑ ගැසීම, බල්ලන් උඩු බිරීම, බළලුන් පොර කෑම වැනි අසුභ යැයි සම්මත නිමිති බොහෝ තිබෙනවා.

සීවලි හිමි :

අවසරයි ! ස්වාමින් වහන්ස ! මටත් ඒ ගැනම තවත් කාරණා එකතු කරන්න පුලුවන්. ගමනක් යන විට හමුවන නිමිති ගැනත් බොහෝ දෙනා

ළඟ නොයෙකුත් විශ්වාස පවතිනවා. පෙර මගට හිස් කළයක් ගෙන ඒම වැනි සමහර සළකුණු වගේ ම හමුවන පුද්ගලයන් අනුවත් බොහෝ දෙනා සුභ අසුභ සොයනවා. ගමනක් යන විට හමු නොවිය යුතු යැයි ගම්වල පිළිගත් අයත් ඉන්නවා. මේ අතරට හිස මුඩු කළ අපත් හසු වෙනවා. ඒ වගේ ම තමයි මඳ සුලඟක් හැමීම, මඳ වැස්සක් ඇද වැටීම, හොඳ සුවඳක් දැනීම, දිය පිරි කළයක් හමුවීම වාගේ දේවල් ගමන සුභයැයි පෙන්වන සළකුණු ලෙස සලකනවා.

මේ සියල්ල සාවධාන ව අසා සිටි මුලසුනෙහි වැඩ හුන් අත්ථදස්සි හිමියෝ සභාව අමතා මෙසේ පැවසුවා. ‘‘ සුභ අසුභ පලාපල පිළිබඳ වැදගත් කාරණා රාශියක් ඉදිරිපත් වුණා. රට තොට ගැන සමාජය ගැන මේ ඇත්තන්ගේ සැලකිල්ල විපරම බොහෝම ඉහල යි. ඔය සුභ අසුභ කථාව අද ඊයේ ඇතිවුන එකක් නොවෙයි. බුදුරජාණන් වහන්සේගේ කාලයේ දීත් මේ වගේම ඇදහිලි තිබුණා පමණක් නොවෙයි ඒ ගැන මහා ආන්දෝලනයක් මහා කෝලාහලයක් ඇතිවුණා. එදත් මේ වගේ ම සුභ වැඩකදී ඇසට මුණ ගැසෙන සුභ නිමිති මංගල යැයි කෙනෙක් කීවා. එහෙම කිව්වේ **දිට්ඨ මංගලිකයෝ**, ඒ වේලාවට ඇසෙන නිමිති මංගල යැයි **සුත මංගලිකයෝ** කීවා. ඒ වගේම නාසයට, දිවට, ශරීරයට, ඒ මොහොතේ දැනෙන නිමිති සුභ හෝ අසුභ වන බව **මුත මංගලිකයෝ** කීවා. ඔවුනොවුන් මේ පිළිබඳ වාද විවාද කළා මිසක් කිසිම කෙනෙකුට නිගමනයකට එන්න බැරි වුණා. මෙය මුළු දඹදිව ම පැතිර ගියා. මේ මංගල කෝලාහලය භූමාටු දෙවියන්ගෙන් ආකාශස්ථ දෙවියන්ටත් එතනින් චාතුර්මහාරාජිකාදි දිව්‍ය ලෝකවලට පමණක් නොවේ අකනිටා බඹලොව දක්වාත් පැතිර ගියා. අන්තිමේ දි සක්දෙව් රජතුමාගේ ඉල්ලීම පරිදි මෙය විමසීමට එක්තරා දිව්‍ය පුත්‍රයෙක් දෙව්රම් වෙහෙරට පැමිණියා. ඒ දෙවියා එක්තරා රාත්‍රියක තමා ගේ සුන්දර ශරීර ප්‍රභාවයෙන් මුලු මහත් දෙව්රම් වෙහෙර ම බබුලුවමින් පැමිණ බුදුරදුන් වැඳ එකත් පසෙක සිටගෙන මෙසේ ගාථාවකින් විමසා සිටියා.

බහූ දෙවා මනුස්සා ච
මඞ්ගලානි අචින්තයුං
ආකඞ්ඛමානා සොත්ථානං
බෲහි මඞ්ගල මුත්තමං

බොහෝ දෙවියෝ ද මනුෂ්‍යයෝ ද උතුම් වූ මංගල කාරණා මොනවාදැයි සිතමින් පසු වෙති. දෙලොව සැප කැමති ඔවුන්ට උතුම් වූ මංගල කරුණු දේශනා කරන සේක් වා.

අසෙවනා ච බාලානං
පණ්ඩිතානඤ්ච සෙවනා
පූජාච පූජනීයානං
එතං මංගල මුත්තමං

(හුස්ම ගන්නා පමණින් ජීවත් වන) අනුවණයන් ඇසුරු නොකිරීම ද, (දෙලොව දියුණුව දන්නා) නුවණැත්තන් ඇසුරු කිරීම ද, පිදිය යුත්තන් පිදීම ද යන මේවා උතුම් වූ මංගල කරුණු වේ.

පතිරූප දෙස වාසො ච
පුබ්බෙ ච කත පුඤ්ඤතා
අත්ත සම්මා පණිධි ච
එතං මංගල මුත්තමං

(පින් කර ගැනීමට) සුදුසු ප්‍රදේශයක වාසය කිරීම ද පෙර කරන ලද පින් ඇති බව ද තම ජීවිතය (ශ්‍රද්ධා සීලාදී ගුණ ධර්මයන්හි) මනා කොට පිහිටුවා ගැනීම ද යන මේවා ද උතුම් මංගල කාරණාවෝ වෙති.

බාහුසච්චඤ්ච සිප්පඤ්ච
විනයො ච සුසික්ඛිතො
සුභාසිතා ච යා වාචා
එතං මංගල මුත්තමං

අසා,දරා, ප්‍රගුණ කළ බොහෝ දේ ඇති බව ද, (ගිහි-පැවිදි ජීවිතයට අවශ්‍ය) ශිල්පවල දක්ෂ බව ද, විනය ගරුක ව මැනවින් හික්මුණු බව ද, (සතරාකාර වාක් දුශ්චරිතයන්ගෙන්) මිදී යහපත් වචන කතා කරන බව ද උතුම් මංගල කාරණාවෝ ය.

මාතා පිතු උපට්ඨානං
පුත්තදාරස්ස සංගහො
අනාකුලා ච කම්මන්තා
එතං මංගල මුත්තමං

මව්පියන්ට උපස්ථාන කිරීම ද, අඹු දරුවන්ට සංග්‍රහ කිරීම ද, නිසි කලට නිසි පිළිවෙළට අනලස් ව, අකුසල් නොවත නිරවුල් දිවිපෙවෙත යෙදීම. යන මේවා උතුම් මංගල කාරණාවෝ වෙති.

දානඤ්ච ධම්ම චරියාච
ඤාතකානඤ්ච සංගහො
අනවජ්ජානි කම්මානි
එතං මංගල මුත්තමං

දන් දීම ද දස අකුසලයෙන් මිදී ධර්මනුකූල ව හැසිරීම ද ඥාතීන්ට සංග්‍රහ කිරීම ද (පෙහෙවස් සමාදන් වීම, උයන්වතු, ඒදඬු, පාලම් තැනීම ආදී) නිවැරදි කටයුතුවල යෙදීම ද යන මේවා උතුම් මංගල කාරණාවෝ වෙති.

ආරති විරති පාපා
මජ්ජපානා ච සඤ්ඤමො
අප්පමාදො’ච ධම්මෙසු
එතං මංගල මුත්තමං

පාපයෙහි නොඇලී ඉන් වැලකීම ද මදයට හා ප්‍රමාදයට හේතු වූ මත්පැන් පානය නොකිරීම ද කුසල් කර්මයන්හි අප්‍රමාද වීම ද මේවා උතුම් වූ මංගල කාරණාවෝ වෙති.

ගාරවො ච නිවාතො ච
සන්තුට්ඨී ච කතඤ්ඤුතා
කාලෙන ධම්ම සවණං
එතං මංගල මුත්තමං

(තෙරුවන්, මව්පියන් හා වැඩිහිටියන්) කෙරෙහි ගෞරව කිරීම ද යටහත් පැවතුම් ඇති බව ද ලද දෙයින් සතුටු වන බව ද කළගුණ දන්නා බව ද සුදුසු කාලයෙහි ධර්ම ශ්‍රවණය කිරීම ද යන මේවා උතුම් මංගල කාරණාවෝ වෙති.

ඛන්ති ච සොවචස්සතා
සමණානඤ්ච දස්සනං
කාලෙන ධම්ම සාකච්ඡා
එතං මංගල මුත්තමං

ඉවසීම ද කීකරු බව ද ශ්‍රමණයන් වහන්සේලා බැහැ දැකීම ද සුදුසු කලහි ධර්ම සාකච්ඡා පැවැත්වීම ද යන මේවා ද උතුම් මංගල කාරණාවෝ වෙති.

තපො ච බ්‍රහ්මචරියා ච
අරිය සච්චාන දස්සනං
නිබ්බාන සච්ඡිකිරියාච
එතං මංගල මුත්තමං

කෙලෙස් තවා ඉඳුරන් හික්මවා ගැනීම ද ලිංගික කාමයෙන් වෙන් වීම ද ආර්ය සත්‍ය අවබෝධ කිරීම ද රහත් වී නිවන සාක්ෂාත් කර ගැනීම ද යන මේවා ද උතුම් මංගල කාරණාවෝ වෙති.

ඵුට්ඨස්ස ලොක ධම්මෙහි
චිත්තං යස්ස න කම්පති
අසොකං විරජං ඛෙමං
එතං මංගල මුත්තමං

අට ලෝ දහමෙහි යමෙකුගේ සිත කම්පා නොවේ ද ශෝක නැති, ඇලෙන කෙලෙස් දූවිලි නැති සසර රඳවන බැඳුම් නැති ඒ රහත් බව ද උතුම් මංගල කරුණකි.

එතා දිසානි කත්වාන
සබ්බත්ථමපරාජිතා
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති
තං තෙසං මංගල මුත්තමන්ති

මේ මංගල කාරණා අනුගමනය කිරීමෙන්, බන්ධන මාරාදී සියලු මාරයන්ට නොපැරදී මෙලොව පරලොව යන හැම තැනදී ම සුවපත් බවට පත් වේ. එහෙයින් මේ කියන ලද කාරණාවෝ ඔවුන්ට උතුම් මංගල කාරණාවෝ වෙති.

## අභ්‍යාස

01. මංගල කාරණා තිස් අට අතුරින් ශිෂ්‍යයකු වශයෙන් ඔබ විසින් සම්පූර්ණ කළ හැකි කරුණු මොනවාදැයි වෙන් කර ලියන්න.

02. මෙම සූත්‍රයේ ඔබ කැමති ගාථාවක් ගෙන ශිෂ්‍ය සමිතියේ දී එහි ඇතුළත් මංගල කාරණා පිළිබඳ ධර්මානුශාසනයක් පවත්වන්න.